**දඹුල්ල මහා නගර සභාව - 2020**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

දඹුල්ල මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

--------------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් මිලදීගත් වර්ෂයේදීම පිරිවැය ගිණුම්වලින් ලියාහැරීම මහා නගර සභාවේ ගිණුම් ප්‍රතිපත්තිය වී තිබුණි. එසේ වුවද, එලෙස වරක් සම්පූර්ණයෙන් ලියාහැර තිබූ වත්කම් පිරිවැය නැවත සමාලෝචිත වර්ෂයේදී රු.18,781,086 ක්ද ඉකුත් වර්ෂයේදී රු.66,359,634 ක්ද ක්ෂය ලෙස ආදායම් වියදම් ගිණුමට ගැලපීම කර තිබුණි. | මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියේ 10/4 අනුව වර්ෂය තුළ මිලදි ගත් ස්ථාවර වත්කම් ක්ෂය නොකරන ප්‍රතිපත්ති අනුගමනය කරයි.එම ප්‍රතිපත්තිය මත 2020 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේදී දේපල පිරියත හා උපකරණ,සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර ඇති බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රතිපත්තියේ 10.2 ඡේදය අනුව ක්ෂය කළ යුතු වීම. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව වෙත ලැබී තිබූ රු.91,093 ක අලාභ ප්‍රතිපූර්ණය කිරීම්ද රු.730,250 න් වූ ඉකුත් වර්ෂයට ගැලපිය යුතු ආදායම්ද තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | පිලිගන්නා බවත් ජ'නල් සටහන් මගින් ගැලපීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාළ රු.3,603,778 ක ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙසද, අවස්ථා 2 කදී සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු එකතුව රු.4,248,482 ක ආදායම් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | ප්‍රමාද දෝෂයන් හේතුවෙන් 2019 වර්ෂය සඳහා ගිණුම්ගත නොවූ එම ආදායම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කළෙමි. | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දිගම්පතහ කසළ කළමනාකරණ භූමියෙහි ඉදිකිරීම් හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල වැය කරන ලද රු.279,533,898 ක මුදල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කිරීම හේතුවෙන් අදාළ වත්කම් ප්‍රදාන, මඟින් ප්‍රාග්ධනයට දායකවීමේ ගිණුමට ගිණුම්ගත කළ යුතු වුවත් ආදායමෙන් ප්‍රාග්ධනයට දායකවීමේ ගිණුමේ දැක්වීමෙන් එම ප්‍රමාණයෙන් ආදායමෙන් ප්‍රාග්ධනයට දායකවීමේ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණයේ පෙන්නුම් කිරීමට කටයුතු කරමි. | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ඇ) | ආදායම් වියදම් ප්‍රකාශයේ ප්‍රාග්ධන ආධාර ආදායම් යටතේ දැක්විය යුතු මුළු ප්‍රාග්ධන ආදායම වූ රු.49,472,393 ක් වුවත් එය රු.4,500,000 ක් ලෙස රු.44,972,393 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම අධාර දිගම්පතහ කසල ප්‍රතිචක්‍රිය ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති මෙම වියදම් ප්‍රතිපූර්ණය වීමේ පදනම මත ලබා ඇති ආධාර වේ. | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ඉ) | ප්‍රාග්ධන ආධාර වියදම් පොදු තැන්පත් ගිණුම හා අත්තිකාරම් ගිණුමෙන් ගෙවීම් කිරීම හේතුවෙන් රු.17,801,253 කින් වියදම් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වියදම් ප්‍රතිපූර්ණය වීමේ පදනම මත ලබා ඇති බැවින් පොදු තැන්පත් හා අත්තිකාරම් ගිණුම මඟින් ගලපා ඇත. | අත්තිකාරම් හා ගිණුම් තැබීම මගින් වර්ෂයේ වියදමට ඇතුළත් නොවන බැවින් මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ඊ) | රු.1,041,595 කට මිලදී ගෙන තිබූ ලී බඩු හා යන්ත්‍ර උපකරණ, රු.682,920 ක්වූ කර්මාන්ත ණයහිමි ශේෂයක්ද රු.16,625,533 ක ගබඩා තොග වටිනාකම්ද රු.70,371 ක් වූ අයිරා පොළියක්ද ගිණුම්වලින්ද අත් හැරී තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වලින් නිවැරදි කරමි. | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (උ) | රු.2,889,667 ක් වූ ලැබිය යුතු විවිධ ආදායම්ද රු.1,531,979 ක් වූ වැසිකිළි ගාස්තු ආදායම්ද රු.512,121 ක් වූ සියයට 1 ව්‍යාපාර බදු ආදායම්ද මූල්‍ය ප්‍රකාශවලින් අත් හැරී තිබුණි. | ලේඛන පරික්ෂා කර බලා කඩිනමින් නිවරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ඌ) | දේශීය ණය සංවර්ධන අරමුදලින් කාර්යයන් 03 ක් වෙනුවෙන් ලබාගෙන තිබූ සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවීමට පැවති රු.124,363,726 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ශේෂය ණය සංවර්ධන අරමුදලින් ලබා ගෙන ඇති ණය මුදල් සම්බන්ධව ප්‍රාදේශීය සභාව සහ මහා නගර සභාව මේ වන විටත් එකඟතාවකට | ගිණුම්වලට නිවැරදිව අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | නොපැමිණි ඇති බැවින්, එම ශේෂයන් ගිණුම්වලට ඇතුළත් කර නොමැත. | |
| (එ) | ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.317,522,806 ක වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරමි. | වෙනස හඳුනාගෙන නිවැරදිව කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඒ) | රු.19,418,646 ක් වූ සංශෝධිත මුදල් ශේෂය වෙනුවට ගැලපීම් නොකළ රු.15,630,919 ක් වූ මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සංශෝධනයට කටයුතු කරන බව. | වෙනස හඳුනාගෙන නිවැරදි ශේෂය ගිණුම්වලට ගැලැපීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 07කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා අනුරූපී වාර්තා අනුව ශේෂය අතර රු.1,610,871 ක වෙනසක් විය. | ගිණුම් ශේෂ 02 ක ශේෂ වෙනසක් නොමැත. ශේෂ 05 ක රු.1,448,494 ක් වූ වටිනාකම තවදුරටත් නිවැරදි කිරීමට ඇත. | වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **පාර්ලිමේන්තු පනත්** | | | |
| I. මහ නගර සභා ආඥා පනත | | | |
| 206(අ) | තාවකාලික ණයක් හෝ අයිරාවක් වශයෙන් යම් කාල සීමාවක් සඳහා සභාව විසින් සාදන ලද ඇස්තමේන්තුව මත පදනම්ව අනුමත කළ හැකි වුවද ඇස්තමේන්තුවක් | ඉදිරි වර්ෂයේ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | ආඥා පනත අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉදිරිපත් කිරිමකින් තොරව රු. 15,630,919 ක අනියම් සේවක වැටුප් ගෙවීම සඳහා අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. | | |
| II. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය | පරිසර බලපත්‍ර කල් ඉකුත් වී තිබුණු කර්මාන්ත 17 ක් සඳහා නව බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත 12 ක් සඳහා පරිසර කමිටුවේ නිර්දේශ ලැබී ඇති බව. | පනතට අනුව කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.19,286,030 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.11,433,711 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ දෛනික කටයුතු පවත්වාගෙන යාමේදී ලැබෙන ආදායමෙන් දැරිය හැකි වියදම් සඳහා බැදීම් ඇතිකරගත යුතු වුවද මහා සභා අනුමැතිය මත සභා අරමුදලින් වැටුප් හා දීමනා ගෙවීමේ පදනම මත අනියම් සේවකයින් 55 දෙනෙකු බඳවාගෙන රු.46,844,174 ක් වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී ද ගෙවා තිබුණි. මෙය සභාවේ මූල්‍ය ගැටළුවට සෘජුව බලපා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුමත කරගන්නා තෙක් අනියම් පදනම මත මෙම සේවකයින් බඳවාගෙන ඇති බව. | මහ නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය අවසානයේදි සමස්ත ආදායම් හිඟය රු.34,180,764 ක් විය. බලපත්‍ර යටතේ සංචාරක හෝටල් ගාස්තු වන අතර අයනොවන ගාස්තු සඳහා නීතිය මඟින් කටයුතු කිරිමටත් හිඟ කඩකුලී වාරික 12 කින් පියවන ලෙසට එකඟ වී තිබුණු බවත් නිරීක්ෂණය විය. | රටේ ඇති වූ තත්වය ආර්ථිකයට බලපෑමක් වූ බැවින් හිඟ ආදායම් වැඩිවීමට හේතු වූ බව. | මහ නගර සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට බස්නැවතුම්පොළ හා තොගපොළ කඩකාමර හිඟ කුලිය රු.10,107,755 ක් විය. | පෙර වර්ෂයේ හිඟයෙන් රු.221,085 ක්ද මෙම වර්ෂය සඳහා රු.291,291 ක්ද අයකරගෙන ඇති බව. | මහා නගර සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මහා නගර සභාවට අයත් කඩ කාමර 21 ක් සමාලෝචිත වර්ෂයේදි කුලියට ලබා දී නොතිබීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ රු.507,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | ඉල්ලුම්කරුවන් ඉදරිපත් නොවූ කඩ කාමර 21 සඳහා තීරණයක් ලබා ගැනීමට නැවත සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බව. | ලබා ගත හැකිව තිබෙන ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියට අයත් දඹුල්ල බස් නැවතුපළට යාබඳව පිහිටි ඉඩමෙහි වර්ග අඩි 3780 ක කොටසක් මහා නගර සභාව විසින් බද්දට ලබාගෙන එහි බාහිර පාර්ශවයේ වියදමින් කඩ කාමර 21 ක් ඉදිකර එයින් නගර සභාවට කඩ කුලියක් ලැබෙන ලෙසට ගිවිසුමකට එළඹ තිබුණි.<br>එම ව්‍යාපෘතියට අදාළ ගිවිසුමෙහි කඩ කාමර කුලිය රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත අයකළ යුතු බවට විධානයක් ඇතුළත් කළ යුතු බවට ආණ්ඩුකාරවරයා විසින් නියෝග කර තිබුණත් එම වගන්තිය වෙනුවටමහ නගර සභාව විසින් තක්සේරු කරනු ලැබූ මාසික කුලිය අයකළ යුතු බවට දක්වා තිබීමෙන් ලැබීමට තිබූ ආදායමක් සභාවට අහිමි වන අතරකඩ කාමර 21 ක් වෙනුවට කඩ කාමර 40 ක ඉදිකිරීම නිසා කඩ කාමර 19 ක ආදායමක්ද සභාවට අහිමි වේ. | අදහස් දක්වා නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.2** **හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.6,048,300 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් (හිඟ වරිපනම් රු.1,342,460, ලැබිය යුතු දැන්වීම් පුවරු රු.1,128,816, ගෙවිය යුතු වැට් රු.1,044,624 , මුද්දර ගාස්තු රු.2,532,400) ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව ජර්නල් සටහන් මඟින් කපා හැර තිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | විධිමත් අනුමැතියකින් පසු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් ශේෂ කපා හැරීමට කටයුතු කළ යුතු වීම. |

**3.3** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලිවැට ඉදිකිරීම නාගරික ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය යටතේ සිදුවෙමින් පවතින අවස්ථාවක අවශ්‍ය අත්තිකාරම් ඔහුට ලබාදීමකින් තොරව 2020 අගෝස්තු 06 දින රු.150,000 ක් යටත් නිලධාරියෙකුට ලබානොදී නාගරික කොමසාරිස්වරයා ලබාගෙන තිබුණි. මෙම ගෙවීම් අනුමත කිරීම, සහතික කිරීම, ලබන්නාගේ අත්සන යන සියල්ල නාගරික කොමසාරිස්වරයා විසින් කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 04 දින වන විට මෙම අත්තිකාරමෙන් රු.90,000 ක් අතරඳවාගෙන තිබුණි. වැසිකිළි පද්ධතියේ හදිසි මිලදී ගැනීම් සඳහා කොමසාරිස්වරයා 2019 අගෝස්තු 03 දින ලබාගෙන තිබුණු රු.100,000 ක අත්තිකාරම් මුදල කිසිදු මිලදී ගැනීමකින් තොරව 2020 ජූනි 15 දින වන විටත් අතරඳවාගෙන තිබුණි. | මෙම අත්තිකාරම් මුදල නාගරික කොමසාරිස් භාරයේ පැවති බවත් අවශ්‍යතාවය පරිදි මුදල් වලින් නිකුත් කර ඇති බවත් රු.100,000 ක අත්තිකාරම් මුදල 2020 ජූනි 12 දින පියවූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එහි සංශෝධිත 2019 මැයි 31 දිනැති අංක 13/2018(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි නියමයන්ගෙන් බැහැරව අනුමැතියකින් තොරව අනුමත සීමාවන් ඉක්මවා මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා නිල වාහනයට 2020 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ අතිරේක රාජකාරි සඳහා ඉන්ධන ලීටර් 785 ක් සඳහා රු. 81,598 ක මුදලක් ගෙවා තිබුණි. | මුදල් කමිටුවේ සහ මහා සභාවේ අනුමැතිය ලබාගෙන ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය ප්‍රකාරව උපලේඛනගත රජයේ නිවාසයක් හිමි නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 10 ක් අයකරගත යුතු බව දන්වා තිබුණද 2017 සැප්තැම්බර් මස සිට 2020 නොවැම්බර් මස දක්වා කාලයට අයකළ යුතු රු.53,575 ක් වූ නිවාස කුලිය නාගරික කොමසාරිස්ගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අධිභාර ක්‍රියාවලියෙන් පසු ඉදිරි කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වූ නාගරික කොමසාරිස්වරයා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිසමේ වැඩ බැලීමේ දීමනා ලබාගැනීමට අනුමැතියක් නොමැතිව හා ආයතන සංග්‍රහයේ 12.5.4 වගන්ති ප්‍රකාරව ස්ථිර තනතුර දරන අතරතුර වෙනත් තනතුරක වැඩ බැලීමේ වැටුප් ලබා දියහැකි වුවද තනතුරක රාජකාරි නොකර වැඩ බලන වැටුප් ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ආරම්භක වැටුපෙන් වැඩ බැලීම් වැටුප් ලෙස සියයට 25 ක් එනම් රු.437,075 ක මුදලක් 2017 සැප්තැම්බර් සිට 2020 ජූලි දක්වා ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති දීමනා අයකර ගැනිමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | නිවාඩු දිනයන්හීදී ක්ෂේත්‍ර රාජකාරිවල යෙදුනු බවට පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ හෝ වෙනත් අදාළ ලේඛනවල හෝ පැමිණීමේ ලේඛනයේ සටහන් කර නොතිබීම හා නිලධාරියා ක්ෂේත්‍ර රාජකාරි ඉටුකළ බවට සනාථ නොකර මාස 03 කට අදාළ දින 15 ක් සඳහා නිවාඩු දීමනා ලෙස රු.56,726 ක් නාගරික කොමසාරිස් වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි. | ක්ෂේත්‍ර රාජකාරි වල යෙදුන බවත් අනුමත කල වැඩසටහන් වලින් සහ ධාවන සටහන් මඟින් තහවුරු වන බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා සීමාවේ පිහිටි පොදු සුසාන භූමි සඳහා 2020 මැයි 06 දින වැට කණු 640 ක් රු.492,800 ක මිලට ගෙන සුසාන භූමියට අදාළ සමිති වෙත නිකුත් කර තිබුණි. භෞතික පරික්ෂාවේදී ලබාදී තිබූ කණු අතරින් රු.42,350 ක් වටිනා කණු 55 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර සුසාන භූමි 05 කට ලබා දී තිබූ රු.207,900 ක් වටිනා කණු 270 ක් මාස 04 ක් පමණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගොඩ ගසා තිබුණි. අදාළ කණු මහා නගර සභා ගබඩාවට ලැබීමට දින14 කට පෙර හා දින 03 කට පෙර සමිතිය වෙත නැවත භාරදුන් බවට ලිපි එවා තිබුණි. | පවතින වසංගත තත්වය හේතුවෙන් හා ශ්‍රමදාන මට්ටමින් කිරිම නිසා ප්‍රමාදයට හේතු වූ බවත් කණු 65 ක් නගර සභා පරිශ්‍රයේ ගෙඩ ගසා ඇති බව. | ඌනතාවයට හා ප්‍රයෝජනයට නොගැනීම සම්බන්ධව පරික්ෂා කර වගකිව යුත්තන් නිශ්චය කිරීම. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කසළ දායකයක් රුපියල් ලක්ෂ 19.4 කට මිලදී ගැනිමට තෝරාගත් සැපයුම්කරු ප්‍රතික්ෂේප කර පූර්ව කාර්ය සාධනයක් ඉදිරිපත් නොකළ හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව දෙවැනි සැපයුම්කරු තෝරාගැනිම නිසා සභා අරමුදලට රු.168,615 ක පාඩුවක් හා ටෙන්ඩර් කොන්දේසි 08 ක්ද කඩකර තිබූ අතර ගිවිසුම් කාලය ඉක්මවිමටද මත්තෙන් විශාල අලුත්වැඩියාවන්ට ලක්ව මෙම දාහකය අබලන් තත්වයේ පැවතුණි. | අංක 06.01.16 දරන සභා තිරණය මත මෙම මිලදී ගැනිම සිදුව ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුද්ගලයන් 03 දෙනෙකුහට ලබාදෙන අධාර මුදල් ලැබීමට සුදුසු පුද්ගලයන්ද යන්න, සනාථ කර ගැනිමකින් තොරව, ඔවුන් තෝරාගෙන අඩු ආදායම් ලාභීන්ට භාණ්ඩ ආධාර ලබාදීම සඳහා රු.748,736 ක ඇස්තමේන්තු 03 ක් සකස් කර තිබුණද අධාර ලැබීමට සුදුසු පුද්ගලයන්ද යන්න සනාථ කර ගැනිමට නොහැකිව නවතා ඇති ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අඩු ආදායම්ලාභීන් බවට ප්‍රාදේශීය ලේකම්ගෙන් තහවුරු වි නොමැති බව. | කර්මාන්ත යෝජනා තහවුරු කරගෙන කටයුතු කළ යුතු වීම. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහා නගර සභාව සතුව ක්‍රියාත්මක වන පෙර පාසලක් නොතිබියදී හා ආරම්භ කිරීමේ පූර්ව සූදානමකින් තොරව පෙර පාසල් පාලිකා තනතුරක් සඳහා බඳවාගෙන ඒවෙනුවෙන් 2019 සැප්තැම්බර් 16 දින සිට නිෂ්කාර්යව රු.576,813 ක් වැටුප් ගෙවාතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයේ මෙම තනතුර පවතින බැවින් එම තනතුරට බඳවාගෙන පුස්තකාල කටයුතු සඳහා යොදවා ඇති බව. | ආයතන සංග්‍රහය හා මු.රෙ. ප්‍රකාරවකට යුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහා නගර සභාවේ මාර්ග කම්කරුවකු ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 31:1:2 වගන්තිය අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අප කීර්තියට පත් වන අයුරින් කටයුතු කිරීම හා එම ඡේදයේ31:1:10 වගන්තිය අනුව රාජ්‍ය සේවය අප කීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම මත 2017 ජුනි01 දින සිට සේවය තාවකාලිකව අත්හිටුවා තිබුණි. ආයතන සංග්‍රහයේ උක්ත ඡේදයට2004 දෙසැම්බර් 15 දින සිදු කළ 06/2009 දරන සංශෝධනය 27:10:2 ප්‍රකාරව අධිකරණ තීරණය ලැබීමට වසරකට වැඩිවන විට වැටුපෙන් භාගයක් ගෙවීම් කිරීමට විෂය බලධාරින්ට බලතල තිබියදී 2020 ඔක්තෝබර් 08 දින සම්පූර්ණ හිඟ වැටුප ගෙවීම හේතුවෙන් රු.602,905 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ආයතනයෙන් පරිබාහිරව සිදුකළ වරදක් නිසා රාජ්‍ය සේවයේ යහපතට කිසිදු හානියක් සිදුනොවන බැවින් නැවත රාජ්‍ය සේවයේ පිහිට වූ බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |